# වාර පරීක්ෂණය - 2016

15.07.2016

| 06 ශ්‍රේණිය | නාට්‍ය හා රංගකලාව | කාලය පැය 02 යි. |
|---|---|---|

නම:-.................................................... පංතිය:-........... අංකය:-........

REFERENCE ONLY

උපදෙස්:

- 1 හා 2 යන කොටස් වලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විතය.
- 1 කොටසේ සියලුම ප්‍රශ්න වලට සහ 2 කොටසේ පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 03කට පිළිතුරු සපයන්න.
- 1 හා 2 ප්‍රශ්න පත්‍ර සඳහා මුළු ලකුණු 50ක් වන අතර, ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු 50ක් වශයෙන් මුළු ලකුණු 100කි.

---

## 01 කොටස

- ප්‍රශ්න අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. පෙර සූදානමකින් තොරව නිරූපණයක් ඉදිරිපත් කිරීම

1. ක්ෂණික නිරූපණයයි  2. අනුකරණයයි  3. සමාරෝපයයි  4. අභිනයයි

02. අලුතින් යමක් සිතීම සහ මවා ගැනීම

1. අනුකරණයයි  2. සමාරෝපයයි  3. පරිකල්පනයයි  4. අභිනයයි

03. අභිනය ප්‍රධාන වශයෙන් කොටස්

1. 02 කි  2. 08 කි  3. 04 කි  4. 16 කි

04. වෙස් මුහුණක් සකස් කර ගැනීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍යයක් වන්නේ

1. කැඩුනු විදුරු කටු  2. රබර් සෙරෙප්පු  3. පුවක් කොළපත්  4. කොස් ලෑලි

05. රංගනයකදී යොදා ගන්නා උපකරණ හඳුන්වන නාමය කුමක්ද?

1. නාට්‍යෝපකරණ  2. වේෂ භූෂණ  3. පසුතල නිර්මාණ  4. රංග වස්ත්‍රාභරණ

- ප්‍රශ්ණ අංක 06 - 10 දක්වා ප්‍රශ්ණ සඳහා A කොටසට ගැළපෙන පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.

| | |
|---|---|
| 06. ශරීරය සැහැල්ලු කිරීමේ අභ්‍යාසයකි | සාත්වික අභිනය |
| 07. මුල මැද අග සහිත කතාන්දරයකි | රංග භාණ්ඩ |
| 08. භාවිතා කිරීමේදී සැහැල්ලු විය යුතුය | 'අහස කඩා වැටීම' |
| 09. ගැමි ජනතාව අතර ප්‍රසිද්ධියක් උසුලයි | හිම කන්ද |
| 10. මුහුණේ ඉරියව් වෙනස් වීම | ජනකතා |

- ප්‍රශ්ණ අංක 11 සිට 15 දක්වා දී ඇති වාක්‍ය නිවැරදි නම් ( ✓ ) ලකුණද , වැරදි නම් ( ✕ ) ලකුණද යොදන්න.

11. සත්ව චරිත පාදක කරගෙන ක්ෂණික නිරූපණයෙහි යෙදිය හැකිය. (   )

12. පන්ති කාමරයේදී පරිහරණය කරන අඩිකෝදුවක් රජෙකුගේ කඩුවකි ලෙස නාට්‍යයකදී භාවිතා කළ හැකිය. (   )

13. ජන කතා මුල, මැද සහ අවසානයක් සහිතව ගෙතී ඇත. (   )

14. නාට්‍යයකදී ප්‍රබල මෙන්ම පැහැදිලි හඬකින් දෙබස් උච්චාරණය කළ යුතුය. (   )

15. වේදිකාව තුළදී අනවශ්‍ය පරිදි හැසිරිය යුතුය. (   )

- ප්‍රශ්ණ අංක 16 සිට 20 දක්වා දී ඇත ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා අදාළ පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.

( ආංගික අභිනය, වාචික අභිනය, සාමූහික, සමාරෝපය, අනුකරණය, වෙස් මුහුණ, මුඛ පරම්පරාවෙන්, )

16. නාට්‍ය කලාව .............................................. කලාවකි.

17. නළුවා වෙනත් චරිතයකට ප්‍රවිශ්ට වීම ............................................ ලෙස හඳුන්වයි.

18. ජනකතා ...................................................................... පැවත එයි.

19. චරිතයකට අදාළව අංග සහ ඉරියව් චලනය කිරීම ............................................ ලෙස හැඳින්වේ.

20. පහතින් දැක්වෙනනේ ............................................................ කි.



## 02 කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.**

01. පහත සඳහන් ගීතමය සංවාද ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

( මල් පාත්තිය මෙන් රඟපාන ගායක පිරිස, අභිනය සහිතව වේදිකාව ඉදිරියට ගමන් කරයි )

"පුංචි කතාවක් කියන්න
පුංචි අපට සවන් දෙන්න
පුංචි පුංචි වැරදි ඇතත්
පුංචි අපට සමාවෙන්න

( ගායක පිරිස පසුපසට ගමන් කරමින් )

පුංචි අපේ කතන්දරේ
කුකුල් හාමි කෙනෙක් වෙතයි
මී හාමිලා හතර දෙනයි
වත්තේ මල් ගස් මේ අපයි

( කුකුල් හාමි එළියට එයි. මී හාමිලා හතර දෙනා දිව එයි. ගායක පිරිස මල් පාත්තිය මෙන් සිටගනී. )

ඈත එපිට ගම්මානෙක
උදෙන් නැගිට
බස බස ගා තටු විහිදා
කුක්කු කූ කූක් කියලා
ඉර පායන ආරංචිය
නොවරදවා ගමට කියන
නියම වෙලාවට හඬලන
කුකුලෙක් හිටියා

කම්මැලි කම අහලත් නැති
වැඩට පලට හොඳට කැමති
සැම කෙනෙකුට හොඳ හිත ඇති
කුකුල් හාමි
තමන්ට ඇති රාජකාරි
ඊටු කරන්නේ හොඳ සතුටින්"

1. මෙම ගීතමය සංවාද කොටස ඇතුළත් නාට්‍යයේ නම කුමක්ද?
2. එම නාට්‍යය නිර්මාණය කර ඇත්තේ කා විසින්ද?
3. මෙම ගීතමය සංවාද කොටසේ ඇතුළත් රංග විධානයක් ලියා දක්වන්න.
4. මෙම ගීතමය සංවාද කොටස රඟ දැක්වීමට අවශ්‍ය චරිත මොනවාද?
5. මෙහි එන කුකුල් හාමිගේ රාජකාරිය කුමක්ද?
6. කුකුල් හාමිගේ චරිතය ඇසුරෙන් අපේ ජීවිතයට ලබා ගත හැකි ආදර්ශ 03ක් ලියන්න.

02\. 1. නාට්‍යයක් යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද?

2. නාට්‍යයක දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ 04 ක් සඳහන් කරන්න.

3. කතන්දරයක දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ 04 ක් සඳහන් කරන්න.

03\. 1. රංග භාණ්ඩයක් සකස් කිරීමේදී යොදා ගනු ලබන අමුද්‍රව්‍ය 02 ක් සඳහන් කරන්න.

2. රංග භාණ්ඩයක් සකස් කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 03 ක් සඳහන් කරන්න.

3. ඔබ විසින් නිර්මාණය කරන ලද රංග භාණ්ඩයක් ඇඳ, එම රංග භාණ්ඩය සාදාගත් ආකාරය සහ එය නාට්‍යට උපයෝගී කරගත් ආකාරය පිළිබඳ කෙටි විස්තරයක් කරන්න.

04\. 1. "පුහුල් හොරා කරෙන් දැනේ" ජන කතාව ලියා දක්වන්න.

2. එමඟින් සමාජයට ගත හැකි ආදර්ශ 03 ක් සඳහන් කරන්න.

3. එම ජන කතාවේ ඔබ සිත්ගත් අවස්ථාවක් චිත්‍රයට නගන්න.

05\. පන්ති කාමරයේ ඔබ විසින් නිර්මාණය කරන ලද නාට්‍යයක් ඇසුරෙන්, පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. ඔබ නිර්මාණය කල නාට්‍යයේ නම කුමක්ද?

2. එම නාට්‍යයේ සිටින චරිත මොනවාද?

3. ඔබ නිරූපණය කල චරිතයට පැවරී තිබූ වගකීම් මොනවාද?

4. එම නාට්‍යයෙන් සමාජයට ලබාදෙන පණිවිඩය කුමක්ද?

5. නාට්‍යයේ කතාව කෙටියෙන් සඳහන් කරන්න.

6. එම නාට්‍යය සඳහා සුදුසු පසුතලයක් ඇඳ දක්වන්න.